# මහනුවර මහා නගර සභාව

## මහනුවර මහා නගර සභාවේ ශ්‍රම මිල දී ගැනීම් පදනම මත GIS තාක්ෂණ සේවා නිලධාරි සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත GIS තාක්ෂණ සේවා සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙ හි වම්පස ඉහළ කෙළවරෙ හි සේවාවේ නාමය සඳහන් කර 2024.02.02 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

### GIS තාක්ෂණ නිලධාරි සේවය

1. මිල දී ගැනීමට නියමිත සේවාව : GIS තාක්ෂණ නිලධාරි සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2. දෛනික දීමනාව : මසකට රු. 50,000.00 බැගින් (මසකට දින 21 ක් රාජකාරී ඉටු කිරීම සඳහා)

3. කායික සුදුසුකම් : අදාළ සේවය ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය හා GIS හා Remote Sensing විෂයක් ලෙස හදාරා සමත් වී තිබීම.

5. වෘත්තීය සුදුසුකම් : GIS නිලධාරි වශයෙන් රජයේ ව්‍යාපෘතියක හෝ දෙපාර්තමේන්තුවක GIS දත්ත හැසිරවීම සම්බන්ධයෙන් වසර 10 කට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.

6. වෙනත් සුදුසුකම් :
   - (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
   - (ii) පූර්වාසන්න වසර 03ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය.
   - (iii) බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරින් පහත කොන්දේසි වලට යටත් ව සේවයට තෝරා ගනු ලැබේ.

   1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.
   2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්ව සියලු අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.
   3. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සේවා සපයා ගැනීම සඳහා බඳවා ගනු ලැබේ.
   4. මෙම බඳවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
   5. සේවය සපයා ගැනීමේ කාලය වසරකි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.

*සටහන :* මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.